シンハラ語

කනිෂ්ඨ සහ උසස්පෙළ පාසල් සිසුන් සඳහා

# මිඑ ප්‍රාන්ත

# ළමා ආඥා පනත

සියලුම දරුවන්ට බියෙන් සැක තොරව ජීවත් කරවීම පිණිස



ඩිජිටල් සංස්කරණය

# ඔබට මෙවැනි ගැටළු තිබේ ද?

වැඩිහිටියන්ගේ අදහස්වලට ඔබව බලහත්කාරයෙන් එකඟ කරවා ගැනීම




සමාජ මාධ්‍ය ඔස්සේ ඔබව විවේචනයට ලක්වීම



හිරිහැරයට ලක්වී වේදනාවට පත් වීම



බියෙන් සැකෙන් තොරව සිටිය හැකි ස්ථානයක් නොමැත



ගෘහස්තගෙදර දොර අත් උදවු අධික බාවින්, පාසල් ගෙදර වැඩ කරගත නොහැකි බව



ගැටළුවක් ඇති වූ විට උපදේශණ ලබා ගත හැකි ස්ථානයක් නොමැතිකම





ළමා අයිතිවාසිකම් සුරක්ෂිත නොවීම සම්බන්ධ මේ උදාහරණ වේ. දරුවන්ගේ සාරවත් හා නිරෝගිමත් වර්ධනය පිළිබඳව කල්පනා කර බලමු ද?



# මිඑ ප්‍රාන්ත ළමා ආඥා පනත පිළිබඳව හැඳින්වීම

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ සංකල්පවලට අනුකූලව, ළමා අයිතිවාසිකම් සහතික කරන සමාජයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් පනවන ලද ආඥා පනතකි.

## ආඥා පනත මගින් වැදගත් යයි සලකන දෑ (මූලික සංකල්ප)

**දරුවන්ට උපතින්ම අයිතිවාසිකම් හිමි වන අතර, කිසිදු හේතුවක් මත ඔවුන්ට වෙනස්කම් කළ නොහැක.**



දරුවන්ට ද වැඩිහිටියන් මෙන් බොහෝ අයිතිවාසිකම් හිමි වන අතර, දරුවන්ට පමණක් හිමිවන අයිතිවාසිකම් ද ඇත. ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවය, සිතන පතන ආකාරය, ආබාධිතභාවය හෝ ආර්ථික තත්ත්වය ආදී, කිසිදු හේතුවක් මත වෙනස්කම් කළ නොහැක.

**දරුවන්ගේ ජීවිත හා සෞඛ්‍යය ආරක්ෂා වී, ඔවුන්ට නිරෝගිමත් ලෙස වැඩෙනු ඇත.**




අපරාධ, අනතුරු සහ භයානක දෑවලින් දරුවන් ආරක්ෂා වී, ඔවුන්ට නිරෝගිමත් ලෙස වැඩෙනු ඇත.

**දරුවන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට සහ බහුවිධ සමාජ ක්‍රියාකාරකම්වලට සහභාගී විය හැකිය**



දරුවන්ට තම සිතුම් පැතුම් සහ අදහස් නිදහසේ වැඩිහිටියන් හට ප්‍රකාශ කළ හැකිය. පාසල හෝ ප්‍රදේශය තුළ සමාජ ක්‍රියාකාරකම්වලට සහභාගී වීම, සහ දරුවන්ගේ අදහස් සමාජය තුල ක්‍රියාවේ යෙදවීම සිදු කල හැකිය

**දරුවන්ගේ එම අදහස්වලට ගරු කෙරෙන අතර, ඔවුන්ගේ වඩාත්ම යහපත පිළිබඳව සැලකිල්ලට ගනු ලැබේ**




දරුවන්ගේ අදහස් වැදගත් කොට සැලකේ. වැඩිහිටියන් විසින්, දරුවන් හට වඩාත්ම යහපත් දෑ කවරේ දැයි ප්‍රමුඛත්වය දී කල්පනා කිරීම වේ.

### ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය යනු කුමක්ද

1989 වසරේ දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලදී. ජපානය 1994 වසරේ දී මෙහි ගිවිසුම්ගත රටක් බවට පත්විය. වැඩිහිටියන්ට සේම දරුවන්ට ද එක් අයෙකු පිණිස වන අයිතිවාසිකම් ඇති බවට පිළිගන්නා අතර, ඔවුන් වර්ධනය වන අවස්ථාවේ දී ආරක්ෂාව සහ සැලකිල්ල අවශ්‍ය කෙරෙන, දරුවන්ට අනන්‍ය වූ, අයිතිවාසිකම් තීරණය කර ඇත.

# දරුවන් වෙනුවෙන් වැඩිහිටියන් සිදු කරන දෑ

ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා, වැඩිහිටි සෑම කෙනෙකුටම කාර්යභාරයන් පැවරේ. දරුවන්ට සහයෝගය දැක්වීම පිණිස, සියලු දෙනා එක්ව කටයුතු කරනු ලබයි.

## භාරකරුවන්

දරුවන්ව ප්‍රවේසමෙන් ඇති දැඩි කිරීමේ වගකීමක් ඇති බව තේරුම් ගෙන, රජය සහ සහාය සංවිධානවලින් අවශ්‍ය සහයෝගය ලබා ගනිමින්, දරුවන්ට බියෙන් සැකෙන් තොරව වර්ධනය විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට උත්සාහ කරනු ලබයි.

## පාසල ආදී අදාළ පාර්ශවයන්

අපි දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමට සහ ඔවුන්ට සාමයෙන් ඉගෙන ගැනීමට සහ වර්ධනය වීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීමට උත්සාහ කරමු. දරුවන්ට ඔවුන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳව ඉගෙන ගෙන, ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට හැකිවන සේ සහය දෙනු ලබයි.

## ව්‍යවසායකයන්

සේවයේ යෙදෙන පුද්ගලයින් හට, රැකියාව සහ පවුල යන දෙකම තෘප්තිමත් ලෙස ගත කිරීමට හැකි වන්නා වූ සේවා ස්ථාන පරිසරයක් නිර්මාණය කර, ප්‍රදේශය තුළ දරුවන්ට වර්ධනය විය හැකි වන සේ සහාය ලබා දෙන ක්‍රමවේද ප්‍රවර්ධනයට උත්සාහ කරනු ලබයි.

## පෙළගැසී සහයෝගය දක්වමු

## සහාය කණ්ඩායම්

විශේෂඥතාවයන් භාවිත කල ක්‍රියාකාරකම් තුළින්, දරුවන්ගේ වර්ධනය නිරීක්ෂණය කර, සහාය වීමට උත්සාහ කරමු.

## ප්‍රාන්ත වාසීන්

දරුවන්ට සම්බන්ධ ප්‍රතිපත්ති පිළිබඳව අවබෝධය වැඩි කර, ක්‍රියාකාරී ලෙස සහයෝගයෙන් කටයුතු කිරීමට උත්සාහ ගනු ලබයි.



## ප්‍රාන්තය

ප්‍රාන්තය විසින්, දරුවන්ට සම්න්බන්ධ ප්‍රතිපත්ති සැලසුම් සහගත ලෙස ක්‍රියාත්මක කර, දරුවන්ගේ අදහස් සහ වඩාත්ම යහපත වැදගත් සේ සලකනු ලබයි. දෙමාපියන්ට, පාසල්වලට සහ ප්‍රදේශවාසීන්ට එක්ව වැඩ කිරීමට උපකාර කිරීම සඳහා අපි නාගරිකය හා නාගරික කොට්ඨාශය සමඟ කටයුතු කරන අතර, දරුවන්ට එක්ව උපකාර කිරීමේ උත්සාහයන්ට අපි සහාය දෙමු.

# මිඑ ප්‍රාන්තය විසින් සිදුකරන දෑ



අපයොජනය කිරීම, හිරිහැර කිරීම ආදී අයිතිවාසිකම් උල්ලංඝනයන්ගෙන් දරුවන්ව ආරක්ෂා කරනු ලබයි.

(11 වන වගන්තිය)

දරුවන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සඳහා දරන උත්සාහයන් ප්‍රවර්ධනය කිරීම





ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන ක්‍රමවේද නිර්මාණය කිරීම

ළමා අයිතිවාසිකම් පිළිබඳව අධ්‍යනය කිරීමට සැමට අවස්ථාවක් ලබාදීම.

(12 වන වගන්තිය)



සියලුම දරුවන්ට සාරවත් හා නිරෝගිමත් ලෙස වර්ධනය විය හැකි වන සේ සහාය ලබා දීම.

(13 වන වගන්තිය)



ඉගෙනීම

සෙල්ලම් කිරීම

තමාගේ ස්ථානයක් නිර්මාණය කිරීම

අත්දැකීම් ලබන ක්‍රියාකාරකම්



විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ වර්ධනයට සහාය වීම

ප්‍රාන්තයේ ක්‍රියාකාරකම්වලට දරුවන්ගේ අදහස් ඇතුලත් කරනු ලැබීම.

(14 වන වගන්තිය)




දරුවන් ඇති දැඩි කරන පවුල්වලට බියෙන් සැකෙන් තොරව ජීවත් වීමට හැකි වන පරිදි සහය ලබා දීම.

(15 වන වගන්තිය)



# තනියම විඳවීම නොකරන්න

ඔබේ පවුල, ඔබේ අනාගතය, ඔබේ මිතුරන් හෝ ඔබ පිළිබඳව කිසිවෙකුට හෝ පැවසිය නොහැකි දෑ

“මගේ කතාව කාට හරි කියන්න අවශ්‍ය වුනත්, කුමක් කල යුතුදැයි නොතේරෙයි”



“උපදේශන ලබා ගැනීමක් ගැන තරමක කාංසාවක් ඇත”

යනුවෙන් සිතීමට ඉඩ ඇත. නමුත්, ඔබේ හැඟීම් වඩාත් ම වැදගත් වන බැවින්. කරුණාකර ඔබේ කතාව, පවසන්න.



## දරුවන් වෙනුවෙන් ඇති උපදේශන දුරකථනය

ළමා ක්ෂණික ඇමතුම්

☎0800-200-2555

විවෘත වේලාව 13:00 - 21:00 දෙසැම්බර් 29 සිට ජනවාරි 3 දක්වා වසා ඇත

*රහස් ආරක්ෂා කෙරේ
*දුරකථන ගාස්තු අය නොකෙරේ (මිඑ ප්‍රාන්තය ඇතුලත ඇමතුම් ගැනීම සඳහා පමණි)

## LINE හරහා ද උපදෙස් ලබා ගත හැක

ළමා ක්ෂණික ඇමතුම් LINE උපදේශනය

විවෘත වේලාව 13:00 - 21:00

දෙසැම්බර් 29 සිට ජනවාරි 3 දක්වා වසා ඇත

*රහස් ආරක්ෂා කෙරේ
*කතාබහ උපදේශනය පමණි

## ඔබ අවට සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා නොවන විට, ඔබ කරන්නේ කුමක්ද?

මිඑ ප්‍රාන්ත ළමා හා සුභසාධන දෙපාර්තමේන්තුව,
උපත් අනුපාතය අඩු වීම වැළැක්වීමේ පිළියම් අංශය 13, කෝමේ-චෝ, ත්සු-ෂි, මිඑ ප්‍රාන්තය, 514-8570
☎：059-224-2404　FAX：059-224-2270　E-mail:shoshika@pref.mie.jp
https://www.pref.mie.lg.jp/common/content/001187904.pdf

මිඑ ප්‍රාන්ත ළමා ආඥා පනතේ සම්පූර්ණ ලේඛනය